# කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
# ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය ( විශේෂ උපාධි )
# පළමු සෙමෙස්තරය -2018/2019
# SLG 2127 – නූතන සිංහල නවකතා සහ කෙටි කතා
(පෑ දෙකයි)

ප්‍රශ්න **හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

---

## I කොටස

01. දහනව වන සියවසෙහි අපර භාගයෙහි සිංහල නවකතාවට පසුබිම සකස් කළ දේශපාලන හා සමාජ සංස්කෘතික සාධක පිළිබඳ විමර්ශනයක් කරන්න.

02. "මුල් කාලීන ප්‍රබන්ධ කතාවල චරිත නිරූපණයට වඩා වැදගත් කොට සැලකුණේ පසුබිම නිරූපණයයි." සනිදර්ශනව පහදා දෙන්න.

03. 'සිරි ගුනසිංහගේ "හෙවනැල්ල" නවකතාවේ සාර්ථකත්වයට හේතු වී ඇත්තේ විඥානධාරා සන්දර්භය යොදා ගැනීමයි.' විමසන්න.

04. වස්තු විෂය, භාෂා රීතිය හා චරිත නිරූපණය පිළිබඳ අවධානය දක්වමින් පහත සඳහන් නවකතාවලින් එකක් පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් කරන්න

   I. චරිත තුනක්
   II. ගේ කුරුල්ලෝ
   III. දූල්වල අලංකාරේ
   IV. බත්තලංගුණ්ඩුව

## II කොටස

05. ආරම්භක යුගයේ සිංහල කෙටිකතාකරුවන් පිළිබඳ හැඳින්වීමක් කොට කෙටිකතාවෙහි විකාශනය සම්බන්ධයෙන් ඔවුන්ගේ මැදිහත්වීම පිළිබඳ සාකච්ඡා කරන්න.

06. සිංහල කෙටිකතාව ප්‍රගමනයෙහිලා මාර්ටින් වික්‍රමසිංහගෙන් සිදු වූ දායකත්වය සනිදර්ශනව විමසන්න.

07. සිංහල කෙටිකතාවෙහි ආකෘතික පක්ෂය පෝෂණයෙහිලා ජී.බී. සේනානායකගෙන් සිදු වූ මෙහෙය පිළිබඳව ඇගයීමක් කරන්න.

08. ජයතිලක කම්මැල්ලවීරගේ 'මාංචු' කෙටිකතා සංග්‍රහය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.